# 2017 ජූලි මස සාංඝික පවුල් දින සුපුවත
# "ඔබ වහන්සේගේ ශුද්ධවූ කැමැත්ත අපට හෙළි කළ මැනව"

01. ආරම්භක ගීය - "දහසක් අතරින් මා තෝරා ගත්තාවූ ……" (කිතනු ගී අංක 174)

- * යෙසායා 49:1 කියවන්න.
  ඔබ පිළිබඳව දෙවියන් වහන්සේගේ සිත හඳුනා ගන්න. ඔබට ඇති විශේෂත්වය අන් සැමට නැත. දහසක් අතරින් නොව, දස දහස් පිරිසක් අතරින් ඔබව තෝරා ගත් කෙනෙකි. අපගේ සැබෑ අනන්‍යතාවය හඳුනා ගනිමු.
- * මේ මොහොතේ කුමන ඇතුලාන්ත තත්ත්වයක්, අපට අප භාරගත නොහැකි තත්ත්වයක සිටියද, දෙවියන් වහන්සේ අද දින ඔබ සැම කැඳවා ඇත. ඒ ඔබව ඔවුන් වහන්සේට අවශ්‍ය නිසාය. **"එතුමාණෝ මා තෝරා ගෙන එතුමාණන්ගේ සේවකයා වන පිණිස මා පත් කළ සේක."** එය දේව කැඳවීමකි. අප පිළිබඳව දේව සිත මෙයයි.
- * අප වෙත දක්වන ඒ මහා ආදරයට දෙවිඳුන් පසසමු. ස්තූති කරමු. වරම් දීමනා අත්දකින ප්‍රශංසාවකට ඇතුළු වෙමු.

- * පුබුදු ගී අංක 38 "සුදත් සුරිඳුනේ වේ ප්‍රශංසා ……"

02. දවසේ සුපුවත:

i * ශු.මතෙව් තුමන් සිය සුපුවත් ප්‍රකාශනයේ 5 වන පරිච්ඡේදයේ ප්‍රකාශ කරන මංගල වාක්‍ය අතරින් **"දිළිඳුවූ ඔබ භාග්‍යවන්තයෝය; මක්නිසාද ස්වර්ග රාජ්‍යය ඔබගේය"** යන්න අපට විශේෂ වන්නේ එය අප වෙනුවෙන් ප්‍රකාශ කළ වාක්‍යයක් බැවිනි. මසකට වරක් සාංඝික පවුල් දිනයක් ලෙස වෙන්කර ගනිමින් පැය 6කට වඩා ආසන්න කාලයක් එකට එක්ව දෙවිඳුන් පසසත්දී, වත්මන් සමාජය තුළ ඉරුදින දිව්‍ය යාගයට පැයක් ගත වීම ඉවසිය නොහැකි ජනතාවක්ද සිටිති.

- * එදිනෙදා ආහාර වේල සපයා ගන්න වෙර දරණ ඒ සහෝදරයා සමඟ එක්ව ආහාර වේලක්, ඔවුන් සමඟ හුවමාරු කර ගනිමින් භුක්ති විඳිය හැකිද? ඔවුනට නිදහස්, සැනසීමක්, සතුටක් ඇද්ද?
- * ස්වාමින් වහන්සේගේ දිනය වන ඉරුදින, තවත් වස්තුව උපයන, ඒ වෙනුවෙන් වැයවීම නවතාලිය හැකිද?
- * සමාජයට අභියෝගයක් වෙමින් , ලක්ෂ සිය ගණන් වැයකර ගන්නා විවාහ මංගල උත්සව වෙනුවට චාම් සරල "සුදු මුදු" විවාහයකට දෙව් ආසිරි මැද ඇතුලත් විය හැකිද?
- * දෙවියන් වහන්සේගේ මන්දිරය විලාසිතාගාරයන් බවට පත් නොකර, මරියදාවට එකඟ සුදු චාම් ඇඳුමෙන් සැරසී සහභාගි විය හැකිද? එසේ කළහැකි වූ ඔබ දිළිඳු වූ නමුත් සැබවින්ම භාග්‍යවන්තය.

ii ඉහළ වැජඹෙමින් , වරදට දඬුවම් කිරීමට බලා සිටින භයංකාර දෙවියන් වහන්සේ, එසේ නොවන බවත් ඒ අපගේම ආදර අබ්බා - ආදර තාත්තා ලෙස ක්‍රිස්තුන් වහන්සේ අප හට භාර දුන් සේක. බහ තෝරන කුඩා දරුවකු තා - තා - තා යන ශබ්ද පිට කරන විට දරුවාගේ පියා 'ඒ මට තාත්තා කියනවා' යනුවෙන් අයිති කරගෙන සතුටු වන්නේ නම්, ස්වර්ගීය අපගේ 'අබ්බා තාත්තා' යනුවෙන් අමතමින් ප්‍රශංසා කරන විට සතුටු නොවන සේක්ද? අප ඔවුන් වහන්සේගේ ආදර දූ පුතුන් නොවන්නේ ද?

iii දෙවියන් වහන්සේගේ ශුද්ධ භාවයෙන් බිඳක් හෝ අත්විඳීමට ලැබීම අතී භයංකාර විය හැක. මන්ද දෙවියන් වහන්සේ ශුද්ධවූ, වෙනස් වූ තැනැන් වහන්සේ නිසාමය. **"ඔබ වහන්සේගේ ශ්‍රී නාමයට ප්‍රශංසා වේවා"** යන තේමාව සමඟින් 1981 වසරේ ශුද්ධාත්ම රැලියේදී ඒ මංගල රාත්‍රිය පුබුදු ජනතාවට කිසිදා අමතක නොවන්නේ එය ඉතා භයංකාර රාත්‍රියක් වූ නිසාමය. ඒ රාත්‍රිය නික්මයාම 19:16-18 හි සඳහන් මෝසස් හා ඊශ්‍රායෙල් ජනතාව දෙවියන් වහන්සේගේ ශුද්ධ භාවය ඉදිරියේ පෙනී සිටි අයුරු සිහිකරන්නක් විය.

මහා හඬින් අකුණු ගසන, විදුලි කොටන, මොර සූරන වැසි මධ්‍යයේ ජනතාව සීතලෙන් වෙව්ලමින්, සිට ගැනීමට පවා නොහැකිව බිම ඇද වැටෙද්දී, ස්වාමි තාත්තාට සිදුවුනා දෙවිඳුන් යදින්න. **"ඔබ අප සමග කථා කරන්න. අපි ඇහුම්කන් දෙන්නම්. ඒත් දෙවියන් වහන්සේ අප සමග කථා නොකරන සේක්වා! මන්ද එසේ කළොත් අප මිය යන්න පුලුවන"** යනුවෙන් මහ හඬින් අයැද සිටියෙ ඒ රාත්‍රියේ ප්‍රකාශ වූ ශුද්ධ භාවය විඳ දරාගත නොහැකි නිසාමය.

iv දෙවියන් වහන්සේ දෙවියන් වන්නේ ඔවුන් වහන්සේ ශුද්ධවූ වෙනස් තැනැත් වහන්සේමය. කිසිවකට, කිසිවෙකුට සමකළ නොහැක. දෙවියන් වහන්සේ දෙවියන් වහන්සේම වන සේක. (යෙසායා 6:3) **"සුවිශුද්ධය, සුවිශුද්ධය, සුවිශුද්ධය සව් බලැති සමිඳාණන් වහන්සේ සුවිශුද්ධය. ඔවුන් වහන්සේගේ තේජසින් මුළු ලොව පිරී ගියේය."** මෙවැනි ප්‍රකාශනයක් පරණ ගිවිසුමෙහි සඳහන් කරනුයේ යෙසායා දිවැසිවරයා පමණි. එළිදරව් පොතෙහි 4:8 වගන්තියෙහි **"වැඩ සිටි, වැඩ සිටින, මතු වඩින සර්ව පරාක්‍රම ස්වාමින් වන දෙවියන් වහන්සේ සුවිශුද්ධය, සුවිශුද්ධය, සුවිශුද්ධයි දිවා රෑ දෙකෙහි නොනැවතී ගයන්නාහ"** යනුවෙන් සඳහන් වේ. මෙය මැනවින් දන්නාවූ සමිඳාණන් වහන්සේ පියාණන් වහන්සේ අමතන්නේ තමන් වහන්සේ පිළිබඳව අබ්බා තාත්තාගේ ශුද්ධවූ සැලැස්ම වෙනස් කරන්න එපා කියලා. **"මා කැමති ලෙස නොව ඔබ කැමති ලෙස වේවා"** (ශු.මතෙව් 26:39) අයැද සිටිනුයේ එබැවිනි. එසේම සිය ශ්‍රාවකයින්ට මෙන්ම අපටත් සමිඳුන් ඉගැන්වූ එකම යාච්ඤාව තුළින් **"ඔබගේ කැමැත්ත ඉටු වේවා! ස්වර්ගයෙහි මෙන් මෙලොවෙහිද එසේම වේවා"** (ශු.මතෙව් 6:10) දැනුවත් කරන සේක. ඒ නිසාම අපද ඒ යැදුම අපගේ යැදුම කරගත යුතු නොවන්නේ ද?

v ආර්ථික වශයෙන් යමක් අතට පත් වූ විට, කිසියම් බලයක් වගකීමක් දරන්නට සිදු වූ විට, ලෝකයෙන් ඒ තුළින් පිළිගැනීමක් ලැබෙන විට මිනිසා නොදැනුවත්වම බලධාරීන් වෙනවා. තමන්ට වඩා ඉහළ කෙනෙක්, බලැති කෙනෙක් නැතැයි සිතනවා. එසේ හැසිරෙනවා. සර්වබලධාරී වෙන්න හදනවා. දෙවියන් වහන්සේ විතරයි සර්වබලධාරී. සර්ව ඥානය, සර්ව බලය ඇත්තේ පූර්ණ අනන්‍යයවූ දෙවියන් වහන්සේට පමණයි. එය අති උසස්. අහස පොළොව අතර පරතරයටත් වඩා උසස්. ඒ නිසා ඔවුන් වහන්සේට සම වෙන්න කාටවත් බැහැ. අපගේ දුබලකම නිසා සීමිත වූ මිනිස් ආදරයට, හැඟීම් වලට කොටු වෙලා අපගේ පොළොවේ සිටින තාත්තා වගේ, අප්පොච්චි වගේ මහෝත්තම වූ ස්වර්ගීය පියාණන් වහන්සේ ගැන සිතන්න එපා. ස්වර්ගීය පියාණන් වහන්සේ අති උසස්. ඒ නිසා නොවේ ක්‍රිස්තුන් වහන්සේ **"ස්වර්ගයේ වැඩ සිටින අපගේ අබ්බා පියාණෙනි"** යනුවෙන් අමතමින් අපටත් එලෙස අමතන්න කියා දෙන්නේ.

* මේ සුභාරංචිය ඔබගේ ජීවිතයට අයිති කරගෙන ඇත්තේ කෙලෙසද? සැබැවින්ම ස්වර්ගීය දෙවි මහෝත්තමයාණෝ ආදර අබ්බා තාත්තා ලෙස ඔබ බාර ගෙන ඇත්තේ කෙසේද? කුඩා කණ්ඩායම් තුළ සාකච්ඡා කරන්න.

03. කුඩා කණ්ඩායම්වල අත්දැකීම් ලබා ගන්න. සෑම කණ්ඩායමක් සඳහා අවස්ථාව ලබා දෙන්න.

* ලෞකික බැඳීම් වලින් මිදිලා, ජීවිතයේ එකම බලාපොරොත්තුව, එකම මාර්ගය කරගත් විශේෂ අත්දැකීම් ලබා ගන්න.

* එසේම එවන් ජීවිත අත්දැකීම් අනුව ගමන් කිරීමේදී විවිධ බාධක නිසා, අවටින් එල්ල වුනු බාධක නිසා ගමන දුර්වල වූ, අඩාල වූ අවස්ථාවන් සිහි කරන්න.

* අන් අයව සතුටු කරන්න, ඔවුන් අතරේ කැපී පෙනෙන්න සමිඳාණන් වහන්සේ මගෙන් ඉල්ලන දෙය පැහැදිලිව පෙනෙද්දී, එයට පිටු පා ලෝකයට යටත් වූ අයුරු සිහි කරන්න. සිතට එකඟව සැබෑ තත්ත්වයම දකින්න.

i දරුවන් හා ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු වලදී

ii විවාහ සංවත්සර, උපන්දින සාද, දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීම්, දූවරුන් තරුණ

වියට පා තබද්දී, විවාහ උත්සව.

04. ඉදිරි වසර 4 මනස්ථාපනයේ කාලයක් ලෙස ශුද්ධාත්ම මංගල මහෝත්සවයේදී ප්‍රකාශයට පත් කෙරිණි.
ඒ පශ්චත්තාපයේ මෙහෙයට ඇතුළු වෙමු. එළිදරව්ව 2:4-5 කියවන්න.

> **"එහෙත් ඔබට විරුද්ධව එක චෝදනාවක් මට ඇත. මුලින් ඔබ මට දැක්වූ ප්‍රේමය දැන් නැත. ඔබ වැටී සිටින්නේ කෙතරම් උස් තැනකින්දැ යි සිහියට ගෙන, මනස්ථාපනය වන්න. මුලින් කළ ක්‍රියා නැවත කරන්න; එසේ නොකළොත්, මනස්ථාපනය නූණොත්, මම ඔබ වෙත පැමිණ, ඔබේ පහන් රුක තිබෙන තැනින් එය ඉවත් කරන්නෙමි."**

i එය ඔබට කෙරෙන අභියෝගයක් නොවන්නේ ද?

ii අප සිටින සැබෑ තත්ත්වය හඳුනා ගනිමු. මනස ස්ථාපනය කර ගනිමු.

iii අබ්බා තාත්තාගේ ආදරයේ පහන් රුක ඉවත් නොකරන ලෙස කන්නලව් කරමු.

05. * අප සිටින තැනින් සිටිය යුතු තැනට ගමන් කිරීමට බලය පතා කුඩා කණ්ඩායම් තුළ යාච්ඤා කරමු.

* දහසක් අතරින් අප තෝරා ගෙන, ලුහු බඳින ප්‍රේමයකින් අප සොයමින්, නැවත නැවත අපව ඔවුන් වහන්සේට සතුකර ගන්නා අබ්බා තාත්තාට ප්‍රශංසා කරමු.

* පුබුදු ගී අංක 134 "පරම අපරිමිත පරිශුද්ධත්වයෙ......"

*****************************

ඔබගේ අවධානය සඳහා :

* ජූලි මස 08 වන සෙනසුරාදා පෙ.ව.08.00 සිට 09 වන ඉරිදා ප.ව.04.00 දක්වා විවාහ අපේක්ෂක සමුළුව ශ්‍රී ප්‍රශංසාරාමයේදී පැවැත්වේ. ඔබ සංඝයෙන් / ප්‍රශංසා එකතුවෙන් සහභාගි වීමට බලාපොරොත්තු වන විවාහ අපේක්ෂක යුවල් පිළිබඳව මරින් තාත්තා වෙත 072-6070795 / 036-3795942 යන දුරකථන අංකයන්ට දැනුම් දෙන්න.

* ජූලි මස 08 වන සෙනසුරාදා පෙ.ව.08.00 සිට ප.ව.04.00 දක්වා සුරුදි සංඝයේ වාර්ෂික දිනය ශ්‍රී ප්‍රශංසාරාමයේදී පැවැත්වේ. ඒ සඳහා ඔබ ප්‍රශංසා ගම්හි සිටින වැඩිහිටි අවිවාහක තරුණියන් සහභාගි කරවන්න. පුබුදුවට සම්බන්ධ නොවන, මෙම දිනයට සම්බන්ධ වීමට කැමැත්තෙන් සිටින වයස අවුරුදු 35 ඉක්මවූ අවිවාහක තරුණියන් සිටී නම් ඔවුන්වද එම දිනයට සහභාගි කරවිය හැකිය.

- ස්තූතියි -